

## "අටවිසි බෝධි වෘක්ෂ රෝපණ කැපකරු දායක වැඩසටහන"

ශාක සංරක්ෂණය පදනම් කරගෙන වඩාත් කාර්යක්ෂම ව හා ඵලදායී ලෙස දායකයන් සම්බන්ධ කරගෙන විහාරස්ථානයන්හි අටවිසි බෝධි රෝපණය කිරීම මෙසේ හඳුන්වයි.

මෙහි දී යම් දායකයකුගේ හෝ දායක කණ්ඩායමකගේ සහභාගීත්වයෙන් යම් විහාරස්ථානයක අටවිසි බෝධි රෝපණයට අදහස් කරන්නේ නම් ඒ සඳහා ඉල්ලීමක් පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය.

## අටවිසි බෝධි රෝපණය සඳහා සලකා බැලිය යුතු කරුණු ..

1 ප්‍රමාණවත් භූමියක් පවතී ද (බෝධි දෙකක් අතර පරතරය අවම වශයෙන් අඩි 12ක් වත් පවත්වා ගැනීම එහි වර්ධනයට වැදගත් ය) යන්න.

2 ප්‍රමාණවත් ජල පහසුකම් පවතී ද යන්න.

3 අවශ්‍ය පරිදි අටවිසි බෝධි වෘක්ෂ නඩත්තු කර රැකබලා ගැනීම සඳහා හැකියාව පවතී ද යන්න.

අදාල තොරතුරු නියමාකාර ව සපයන ලද ඉහත අවශ්‍යතාවයන් සහිත විහාරස්ථාන සඳහා පරිසර අමාත්‍යාංශය මගින් අටවිසි බෝධි වෘක්ෂ හා ඒවා නාමකරණයට අදාල පුවරු ලබාදීම සිදුකරයි. එසේ ම රෝපණයට අදාල තාක්ෂණික දැනුම ද අමාත්‍යාංශය මගින් සපයනු ඇත.

අමාත්‍යාංශය මගින් ලබාදෙන අටවිසි බෝධි වෘක්ෂ නියමිත පරිදි රෝපණය කර අදාල කැපකරු දායකයා මගින් හෝ අදාල කැපකරු දායක කණ්ඩායම මගින් ඉදිරියට රැකබලා ගැනීම හා නියමිත පරිදි නඩත්තු කිරීම සඳහා වැඩ පිළිවෙලක් තිබිය යුතු ය.

**අටවිසි බෝධි වෘක්ෂ රෝපණ කැපකරු දායක ක්‍රමයට ඔබගේ ඉල්ලීම් පහත ලිපිනයට යොමු කරන්න.**

BDS
BIODIVERSITY SECRETARIAT

**අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව)**
**ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයය**
**අංක 980/4, වික්‍රමසිංහ පෙදෙස,**
**ඇතුල්කෝට්ටේ**

කොහොඹ ගස වැවීමෙන් දීර්ඝායු ලැබේ. එසේම මාර්ග ආසන්නයෙහි මගීන්ගේ යහපත සඳහා අඹරුක් වැවීමෙන් දෙව්ලොව සැප ලැබෙයි. කැල ගසින් ආරක්ෂාව ද වරා ගසින් සූර්ය දිව්‍ය ලෝකයෙහි ජීවනය ද ලැබේ. බෙලි ගස රෝපණයයෙන් ශිව ලෝකයෙහි ජන්මලාභය ලැබේ. පළොල් ගස වැවීමෙන් ගිරිදුවගේ දෙව් ලොවට යා හැකිය. ඇටිටේරියා ගස වැවීමෙන් දෙවඟනන් සමග ජීවත්වීමේ භාග්‍ය ලැබේ. ඵල පුෂ්ප හා සිසිල් සෙවණ ද දෙන රුක් තිහක් වවන මිනිසා නිරයට නොයයි.

-පද්ම පුරාණය-

කුල වෘද්ධිය හා ධන වෘද්ධිය ද සදාකාලික සැපත ද කැමති වන්නේ නම්, සුගන්ධවත් පුෂ්පයෙන් හා ඵලයෙන් යුක්ත වෘක්ෂ කිසිවිටකත් නොකපන්නේ ය. චෛත්‍ය, සුසාන, විහාර, ආශ්‍රම ආදී ස්ථානයන් හි පිහිටි වෘක්ෂ ඡේදනය කිරීමෙන් දුර්භික්ෂ හා වසංගත ද රටෙහි පැතිරෙයි. මගීන් හට සිසිල් සෙවණ දෙන තුරු පෙළ සිඳින මිනිසා අසිපත් නිරයේ දුකට පැමිණෙයි.

-අග්නි පුරාණය-

-සැකසුම-
ගාමිණි ගමගේ /ටී.එම්. අනුරුද්ධ තෙන්නකෝන්

# අටවිසි බෝධි වෘක්ෂ රෝපණ කැපකරු දායක වැඩසටහන



ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
පරිසර අමාත්‍යාංශය

2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම වෙනුවෙන් ප්‍රකාශයට පත් කරන ලදි

# අටවිසි බෝධි වෘක්ෂ රෝපණ කැපකරු දායක වැඩසටහන

ජීවී පරිණාමයේ දී ප්‍රධාන ජීවී කාණ්ඩයක් ලෙස පරිණාමය වූ ගස් කොළන් පොදුවේ ශාක නමින් හඳුන්වන අතර, සෘජු හා වක්‍ර ආකාරයට සියලු ම සත්ත්වයන්ට ආහාර සපයන මෙම ජීව කොටස පිරිසිදු වාතය ලබාදීම, කාලගුණ තත්ත්ව සමනය කර සුවදායි පරිසරයක් ඇති කිරීම වැනි බොහෝ සේවාවන් මානවයා ඇතුළු සත්ත්වයිනට සලසාලයි. විශේෂයෙන් බහුවාර්ෂික අඩි 20කට වඩා උස ශාක  වෘක්ෂ ලෙසින් හඳුන්වන අතර, ඒවා මානව සංහතියේ පැවැත්ම සඳහා අමිල සේවාවක් ඉටුකරයි.

වර්තමානයේ පවත්නා සියලු ම ආගම් කිසියම් හෝ ආකාරයකින් ශාක සමග සබඳතා ගොඩනගා ඇත. ආගමික සංස්කෘතික පරිසරය තුළ ශාක පිළිබඳ වටිනාකම අනෙකුත් සත්ත්වයින් සඳහා තක්සේරු කරන වටිනාකම් සියල්ල අභිබවා යෑම කැපී පෙනෙන ලක්ෂණයකි.

බෝධි යන්නට විවිධ අරුත් රාශියක් ඉදිරිපත් කර ඇති අතර, ඒවායින් සෝවාන් ආදි සතර මාර්ග දන්නා නුවණ හා මහබෝසතාණන් වහන්සේලාට බුදු බව ලැබීමට සෙවණ ලබාදුන් වෘක්ෂය යන්න කැපී පෙනෙයි.

බෝධි වෘක්ෂ පිළිබඳ ව ලියවී ඇති පැරණි පොත් පත් අතර, පොදුවේ බෝධි වංශය ග්‍රන්ථයෙන් සුවිසි බුදුරජාණන් වහන්සේලාට බුදු බව ලැබීමට සෙවණ ලබාදුන් බෝධීන් වහන්සේලා පිළිබඳ විස්තර කරයි. ගෞතම බුදු රජාණන් වහන්සේගේ චරිත කතාවත්, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ වංශ කතාවත් අදාල විස්තර වැඩිදුරටත් දක්වා ඇත. මෙම භද්‍රකල්පයට පෙර විසූ තණ්හංකර, මේධංකර, සරණංකර හා දීපංකර බුදුරජාණන් වහන්සේලාගේ බෝධි වෘක්ෂ ද ඇතුළත්ව ඉහත සුවිසි බෝධි වෘක්ෂ සමග අටවිසි බෝධි පන්තිය නිර්මාණය වී ඇත.



ශ්‍රී ලංකාව් බෝධි පන්තිය පිළිබඳ සලකා බලන විට අෂ්ඨ ඵලරුහ බෝධි, දෙතිස් ඵලරුහ බෝධි, සූතිස් බෝධි, ආනන්ද බෝධි හා අටවිසි බෝධි ඉතා වැදගත් වේ. ජය ශ්‍රී මහා බෝධි අංකුරය මහ මෙවුනා උයනේ රෝපණය කළ මොහොතේ ම හටගත් ඵලයක් රෝපණය කිරීමෙන් එවේලේ ම හටගත් බෝධින් අට අෂ්ඨ ඵල බෝධින් වේ. තවත් ඵල හතරකින් එකකින් අට බැගින් බෝධි 32 ක් හට ගැනුණු අතර, එම බෝධි දෙතිස් ඵල බෝධි ලෙස හඳුන්වයි.

බුදුරජාණන් වහන්සේලාගේ ධාතූන් වහන්සේලා හැරුනුවිට ජීවමාන වස්තුවක් ලෙසින් උන්වහන්සේලා පිටදුන් බෝධිවලට පුද සැලකිලි දැක්වීම ආගමික චතාවතකි. බෝධිය පිදීමේ නියම මාර්ගය පිළිවෙත් සපුරා බුදු දහම අනුව ගොස් බෝධි පූජා පවත්වා බියෙන් හා ලෙඩ දුකෙන් මිදීමයි.

ඉහත දක්වා ඇති ආකාරයට වෘක්ෂ හා විවිධ ආගම් අතර තිබෙන ධනාත්මක සබඳතාවන් ප්‍රමුඛ ව භක්තිය පදනම් කොට වෘක්ෂ ඇතුළු උද්භිද විවිධත්වය ආරක්ෂා කර සංරක්ෂණය කිරීම සඳහා පරිසර අමාත්‍යංශය අටවිසි බෝධි රෝපණ වැඩසටහන නිර්මාණය කර ඇත.

පාලි භාෂාවෙන් සඳහන් වී ඇති අටවිසි බෝධි වෘක්ෂ සිංහල භාෂාවට පෙරලීමේ දී හා විද්‍යාත්මක නාම හා සැසඳීමේ දී විවිධ අටවිසි බෝධි වෘක්ෂ ලැයිස්තු නිර්මානය වී තිබූ අතර, පරිසර අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් පත්කළ කමිටුවක් තුලින් නිවැරදි ලැයිස්තුව පිළියෙල කර ඇත.

# අට විසි බෝධීන් වහන්සේලා

| බුදු හිමි නාමය | පිටදුන් බෝධියේ ත්‍රිපිටකයේ සඳහන් නම (සිංහල නම වරහන් තුළ) | උද්භිද විද්‍යාත්මක නාමය |
|---|---|---|
| තණ්හංකර බුදුහිමි | රුක්අත්තන | *Alstonia scholaris* |
| මේධංකර බුදුහිමි | කැල, ගස්කැල | *Butea monosperma* |
| සරණංකර බුදුහිමි | පලොල් | *Stereospermum suaveolens* |
| දීපංකර බුදුහිමි | කප්පිත්ත/පතනබෝ | *Ficus arnottiana* |
| කොණ්ඩඤ්ඤ බුදුහිමි | සාලකල්‍යාණ (ඉන්දියානු සල්) | *Shorea robusta* |
| මංගල බුදුහිමි | නාග (නා) | *Mesua ferrea* |
| සුමණ බුදුහිමි | නාග (නා) | *Mesua ferrea* |
| රේවත බුදුහිමි | නාග (නා) | *Mesua ferrea* |
| සෝභිත බුදුහිමි | නාග (නා) | *Mesua ferrea* |
| අනෝමදස්සී බුදුහිමි | අර්ජුන (කුඹුක්) | *Terminalia arjuna* |
| පදුම බුදුහිමි | මහාසොණ (මුරුත) | *Lagerstroemia speciosa* |
| නාරද බුදුහිමි | මහාසොණ (මුරුත) | *Lagerstroemia speciosa* |
| පදුමුත්තර බුදුහිමි | සරල (හොර) | *Dipterocarpus zeylanicus* |
| සුමේධ බුදුහිමි | නීප (බක්මී) | *Nauclea orientalis* |
| සුජාත බුදුහිමි | වෙළු (කොළ උණ) | *Bambusa vulgaris* |
| පියදස්සී බුදුහිමි | කුකුධ (රුක්) | *Horsfieldia iryaghedhi* |
| අත්ථදස්සී බුදුහිමි | චම්පක (සපු) | *Michelia champaca* |
| ධම්මදස්සී බුදුහිමි | කුරාවක/බිම්බජාල (රත් කරව්) | *Margaritaria  indicus* |
| සිද්ධත්ථ බුදුහිමි | කනිකාර (කිණිහිරියා) | *Cochlospermum religiosum* |
| තිස්ස බුදුහිමි | අසන (අසන) | *Terminalia tomentosa* |
| පුස්ස බුදුහිමි | ආමල (නෙල්ලි) | *Phyllanthus emblica* |
| විපස්සී බුදුහිමි | පාඨලී (පලොල්) | *Stereospermum suaveolens* |
| සිඛී බුදුහිමි | පුන්ඩරීක (ඇටඹ) | *Mangifera zeylanica* |
| වෙස්සභූ බුදුහිමි | සාල (ඉන්දයානු සල්) | *Shorea robusta* |
| කකුසඳ බුදුහිමි | සිරීස (මාර) | *Albizia lebbek* |
| කෝණාගම බුදුහිමි | උදුම්බර (අට්ටික්කා) | *Ficus racemosa* |
| කාශ්‍යප බුදුහිමි | නිග්‍රෝධ (නුග/මහනුග) | *Ficus bengalensis* |
| ගෞතම බුදුහිමි | අස්සත්ථ (ඇසතු බෝ) | *Ficus religiosa* |